රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව

அரச கணக்குகள் திணைக்களம்

# Department of State Accounts

| මගේ අංකය / எனது இல. / My No. | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date | 2017.07.04 |
|---|---|---|---|


රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක -: 257 /2017

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්

දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ

දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත

**<u>භාණ්ඩාගාර ගිණුම් ප්‍රකාශන සමඟ දෙපාර්තමේන්තු ගිණුම් වාර්තා සැසඳීම</u>**

සියලුම ආයතනයන් විසින් සෑම ලිත් මාසයක් අවසානයේදීම තම දෙපාර්තමේන්තුවට අදාළ භාණ්ඩාගාර මාසික ගිණුම් ප්‍රකාශනයන් රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ (www.treasury.gov.lk/web/department-of-state-accounts/links) වෙබ් අඩවියට පිවිස ලබාගත යුතු අතර එහි සහතික කළ පිටපතක් ආයතනයේ විගණන භාර විගණන අධිකාරි වෙත ලබාදීමට කටයුතු කළ යුතු ය.

02. සෑම ආයතනයක්ම එම ආයතනයට අදාළ වන පහත සඳහන් ගිණුම්වල නිවැරදිතාවය පිළිබඳ දෙපාර්තමේන්තු ගිණුම් පොත් සහ භාණ්ඩාගාර මාසික ගිණුම් ප්‍රකාශනයන් සමඟ සංසන්දනය කිරීමට කටයුතු කළ යුතු ය.

| ගිණුම් විස්තර | භාණ්ඩාගාර ප්‍රකාශන | |
|---|---|---|
| 1. වියදම් ගිණුම් | (Table 31, 33) | සැසඳේ/ නොසැසඳේ |
| 2. අධිභාර ගිණුම් | (Table 31) | ,, |
| 3. ආදායම් ගිණුම් | (Table 66) | ,, |
| 4. ආදායමෙන් ආපසු ගෙවීම් | (Table 66) | ,, |
| 5. තැන්පතු ගිණුම් | (Table 67) | ,, |
| 6. අත්තිකාරම් ගිණුම් | (Table 67, 68, 69) | ,, |
| 7. අග්‍රිම ගිණුම් | (Table 67) | ,, |
| 8. ස්ථාවර වත්කම් ගිණුම් | (Table 67, 72(1)) | ,, |
| 9. මුදල් රෙගුලාසි 66 සහ අතිරේක ප්‍රතිපාදන | (Table 73) | ,, |
| 10. කුලී හා වැඩ අත්තිකාරම් ගිණුම් | (Table 67) | ,, |
| 11. ප්‍රධාන ලෙජරයේ වෙනත් ගිණුම් | (Table 67) | ,, |


මහා භාණ්ඩාගාරය, කොළඹ 01, ශ්‍රී ලංකාව. பொது திறைசேரி, கொழும்பு 01, இலங்கை. General Treasury, Colombo 01, Sri Lanka.

General - Tel.: +94 11 2484500/600 Ext:1149 Fax: +94 11 2484869 Website: www.sad.gov.lk

Director General - Tel.: +94 11 2484728 Fax: +94 11 2473856 e - mail: dgsa@sad.treasury.gov.lk

03. භාණ්ඩාගාර මාසික ගිණුම් ප්‍රකාශන සහ දෙපාර්තුමේන්තු ගිණුම් පොත් සැසඳීමේදී ඒවා අතර වෙනසක් වේනම් එම වෙනසට අදාළ හේතුන් සොයාබලා ඊළඟ මාසික ගිණුම් සාරාංශයට පෙර කඩිනමින් එම වෙනස්වීම් නිවැරදි කර ගැනීමට ආයතනය විසින් කටයුතු කළ යුතු ය.

04. මාසික ගිණුම් සැසඳීමේදී වාර්ෂික අයවැය ඇස්තමේන්තු මගින් ප්‍රතිපාදන සලසා නොමැති වැය විෂයන්ට සහ ආදායම් ශීර්ෂයන්ට සිදුකරන හර හා බැර කිරීම්, වාර්ෂික ඇස්තමේන්තු ඉක්මවා ගිණුම්ගත කිරීම් සහ වෙනත් ගිණුම්වලට සිදුකරන ලද වැරදි ගිණුම් තැබීම් පිළිබඳ විශේෂ අවධානයක් යොමු කළ යුතු අතර එලෙස වැරදි ලෙස ගිණුම්ගත කිරීම් ඊළඟ මාසයේ ගිණුම් සාරාංශ රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වෙත එවීමට පෙර නිවැරදි කිරීමට කටයුතු කළ යුතු ය.

05. මාසික ගිණුම් සැසඳීම් වාර්තා තවදුරටත් තැපැල් මගින් දෙපාර්තමේන්තුව වෙත යොමු නොකළ යුතු අතර, 2017 ජූලි මසට පසු මාසික ගිණුම් සැසඳීම් වාර්තා එවීමේදී newcigas.treasury.gov.lk වෙබ් අඩවියට පිවිස එහි ලියාපදිංචි වීමෙන් පසු එහි ඇති Monthly Account Reconciliation මෙනුව යටතේ ඇති උපදෙස් අනුව මාසික ගිණුම් සැසඳීම් තොරතුරු ඇතුළත් කර මෙම දෙපාර්තමේන්තු වෙත යොමු කිරීමට කටයුතු කළ යුතු ය.

06. මෙම වැඩසටහන හරහා මාසික ගිණුම් සැසඳීම් සාරාංශ යොමු කිරිමේදී ගැටළුවක් වේනම් එම වැඩසටහනෙහිම ඇති Express email මෙනුව යටතේ දෙපාර්තමේන්තුව වෙත email පණිවිඩයක් යොමු කිරීමෙන් හෝ දුරකථන අංක 0112484826 මගින් සහකාර අධ්‍යක්ෂ තර්ශන් මහතා අමතා ලබාගත හැක.

07. මෙම චක්‍රලේඛය මෙම විෂයට අදාළව මීට පෙර නිකුත් කළ සියලුම චක්‍රලේඛ අභිබවනු ඇත.

එස්.ජී.සේනාරත්න

අධ්‍යක්ෂ ජනරාල්

පිටපත: විගණකාධිපති